**ශීර්ෂ 248 - සුරාබදු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1.1 විගණන විෂය පථය

 සුරාබදු දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වු කළමනාකරණ විගණන වාර්තාව සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත 2015 ඔක්තෝබර් 30 දින නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.** **ගිණුම්**

**2.1** **විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 730.45 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 698.29 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් රු.මිලියන 32.16 ක් හෙවත් සියයට 4.4 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 547.95 | 547.87 | 0.08 | 0.01 |
| මූලධන | 182.50 | 150.42 | 32.08 | 17.58 |
| **එකතුව** | 730.45 | 698.29 | 32.16 | 4.40 |

**2.2** **ආදායම් ගිණුම්**

**ඇස්තමේන්තගත හා තථ්‍ය ආදායම්**

2014 වර්ෂය සඳහා ආදායම් සංකේත 23 ක් සඳහා එකතුව රු.මිලියන 74,035.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 69,123.60 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 93.36 ක් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් ගණන්දීමේ නිලධාරි | ආදායම් සංකේතය | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව | තථ්‍ය ආදායම | (අඩුවෙන්)/ වැඩියෙන් එකතුකිරීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| සුරාබදු කොමසාරිස් ජනරාල් | 10.02.04.01 | 74,000.00 | 69,087.99 | (4,912.01) | 93 |
| - එම - | 10.02.06.00 | 35.00 | 35.61 | 0.61 | 102 |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

සුරාබදු දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 24801 | 32.00 | 25.43 | 22.00 | 25.23 | 195.00 | 129.84 |

## 2.4 අග්‍රිම ගිණුම

සුරාබදු දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 315.09 ක් විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම්

සුරාබදු දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 315.09 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පතුවේ නම | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| පොදු තැන්පතු | 6000/0000/00/0015/0128/000 | 31.62 |
| ක්ෂය සංචිත අරමුදල | 6000/0000/00/0008/0051/000 | 24.53 |
| තෑගි අරමුදල | 6000/0000/00/0006/0060/000 | 258.94 |
| **එකතුව** | | **315.09** |

## 2.6 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සුරාබදු දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

## 3. ශීර්ෂ 248 - සුරාබදු දෙපාර්තමේන්තුව

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ii) | පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | පුද්ගල පඩිනඩි ලේඛන | මුදල් රෙගුලාසි 453 | පවත්වා නොතිබුණි. |
| (iv) | දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (v) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 | පවත්වා නොතිබුණි. |

**3.2 විගණන සාක්ෂි නොවීම**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව සතු වාහන 5කට අදාලව වාහන ලියාපදිංචි පොත්වල මුල් පිටපත් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) නුවරඑළිය සුරාබදු ස්ථානය ඉදිකිරීම සම්බන්ධ 2014 වර්ෂයට පෙර ලිපිගොනුව විගණන කටයුතු සඳහා ඉල්ලා සිටියද, එම ලිපිගොනුව 2015 සැප්තැම්බර් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.3 ආදායම් ගිණුම්**

-----------------

සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට, ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් ආදායම් සංකේත 2 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරය පැවැරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාලව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) 10-02-04-01 දරන ආදායම් සංකේතය - සුරාබද්ද (මත්පැන්)**

-----------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ සුරාබදු (මත්පැන්) ආදායම ලෙස රැස්කිරිමට රු.74,071,000,000 ක් වූ ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. එම ආදායම් ඇස්තමේන්තුව රු.74,000,000,000 දක්වා සංශෝධනය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.69,087,998,770 ක් රැස්කර තිබුණි. එය සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 93 ක් වි තිබුණි. ඒ අනුව රු.4,912,001,230 කින් අපේක්ෂිත ආදායම් ඉලක්ක ලඟාකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 85(2)(අ) පරිදි ඇස්තමේන්තු වෙනස් කිරීමට අවශ්‍ය බව පෙනේ නම්, ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් ඊට හේතු සහිතව ඒ බව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එලෙස කටයුතු කළ බව තහවුරු කිරීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ස්ප්‍රීතු දේශීයව මිලදී ගැනීමේදී හා ආනයනයේදී අය කරනු ලබන රඳවා ගැනීමේ බදු මුදල්, එම ස්ප්‍රීතු යොදා ගනිමින් නිෂ්පාදනය කරනු ලබන මත්පැන් සඳහා අදාල සුරාබදු ගෙවීමේදී හිලව් කිරීමට ඉඩදෙනු ලබන අතර, වර්ෂය අවසානයට පවතින ඉතිරි ස්ප්‍රීතු තොගයට අදාළ රඳවා ගැනීමේ බදු මුදල් ඉදිරි වර්ෂවලදී හිලව් කළ යුතු වුවත්, 2014 දෙසැම්බර් 31 දිනට පැවති ස්ප්‍රීතු තොගයට අදාල රු.511,467,525 ක් වූ රඳවා ගැනීමේ බදු මුදල සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(iv) දෙපාර්තමේන්තුවේ ආදායම් අංශයේ වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ හිලව් කිරීමට ඉඩ ලබා දී ඇති රඳවා ගැනීම් බදු මුදල රු.2,767,065,356 ක් වුවද, ගිණුම් අංශයේ වාර්තා අනුව එය රු.2,786,844,177 ක් හෙවත් රු.19,778,821 ක වෙනසක් පැවතුණි.

(v) මත්පැන් අපනයනයේදී, අපනයන බදු ප්‍රතිදාන ලබා දීම සඳහා දෙපාර්තමේන්තුව විසින් පදනම් කරගනු ලබන්නේ අපනයනකරු විසින් ඉදිරිපත් කරනු ලබන රේගු අපනයන පත්‍රය පමණි. මේ අනුව සත්‍ය වශයෙන්ම අපනයනය කරන ලද ප්‍රමාණය දැන ගැනීම සඳහා ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසානයටත් සකස් කර නොතිබුණි.

(vi) 2013 දෙසැම්බර් 31 දිනට රු.1,527,265,037 ක් වූ හිඟ ආදායම 2014 දෙසැම්බර් 31 දිනට රු.1,534,977,463 ක් දක්වා රු.7,712,426 කින් වැඩි වී තිබුණි.

(ආ) **10-02-06-00 දරන ආදායම් සංකේතය - දුම්කොළ බද්ද**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ දුම්කොළ බදු ආදායම ලෙස රු.38,000,000 ක් ඇස්තමේන්තු කර පසුව එය රු.35,000,000 ක් දක්වා ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.35,606,823 ක් හෙවත් සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 102 කින් ආදායම් රැස්කර තිබුණි.

(ii) දෙපාර්තමේන්තුව විසින් සිගරට් අපනයනය සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කරනු ලබන අතර අපනයනය කරනු ලබන සිගරට් ප්‍රමාණය සත්‍ය වශයෙන්ම අපනයනය කර තිබේද යන බව තහවුරු කර ගැනීමට අදාල ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් සකස් කර නොතිබුණි.

(iii) බීඩි නිෂ්පාදනයේදී බීඩි කොළ ආනයනය සඳහා දෙපාර්තමේන්තුව විසින් බලපත්‍ර නිකුත් කළද බීඩි කොල කොපමණ ප්‍රමාණයක් ආනයනය කරන ලද්දේද යන්න තහවුරු කර ගැනීමට ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් සකස් කර නොතිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක. 24801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට වර්ෂ 01 සිට වර්ෂ 10 ක කාල පරාසයක සිට පැවත එන රු.2,632,985 ක හිඟහිටි ණය ශේෂ පැවැතුණි. එම හිඟහිටි රු.1,787,145 ක ණය ශේෂයක් අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබූ ණය ශේෂවල ඇතුළත් වැඩ තහනමට ලක්ව වසර 10ක් ඉක්මවූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.204,978 ක ණය ශේෂද, වැඩ තහනමකට ලක්ව වසර 04 ඉක්මවූ නිලධාරීන් තිදෙනෙකුගෙන් අය විය යුතු රු.234,901 ක ණය ශේෂද, 2015 සැප්තැම්බර් 30 දින වන විටත් අය කරගෙන නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ සේවය හැරගිය නිලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.191,160 ක් අයවීමට තිබූ අතර, එයින් රු.190,160 ක් ණය ශේෂ වසර හතරකටත් වැඩි කාලයක සිට හිඟ හිටවට පැවතුණි.

**3.5 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම අසම්පූර්ණව පිළියෙල කර තිබුණි.

**3.5.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව, 2014 වර්ෂය සඳහා වූ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සියළුම අංශ ආවරණය වන පරිදි පිළියෙල කර නොතිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) හිමිකාරත්වය වෙනත් ආයතන සතු වාහන දෙකක් දෙපාර්තමේන්තුව විසින් අවිධිමත්ව පරිහරණය සඳහා යොදා ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව සතු වාහන පිළිබඳ සමීක්ෂණයක් කර, එම සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.7 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (i) ව්‍යවස්ථාපිත විධිවිධාන | |
| 1999 අංක 08 දරන දුම්කොළ බදු පනතේ 17 වන වගන්තිය | දුම්කොළ බදු තැගී අරමුදලක් ස්ථාපිත කළ යුතු වුවත්, එසේ කිරීමට කටයුතු කර නොතිබුණි. |
| **(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| • මුදල් රෙගුලාසි 85(2)(ආ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නොදන්වා ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණි. |
| • මුදල් රෙගුලාසි 104(4) | දෙපාර්තමේන්තුවේ අවස්ථා 02 කදී සිදු වී තිබුණු අලාභහානි සම්බන්ධයෙන් එම අලාභහානිය සිදු වූ දින සිට මාස තුනක් ඇතුළත පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| • මුදල් රෙගුලාසි 389(ආ) | චෙක්පත් අතට භාරදීමේදී එය භාර ගත් බවට එහි අංකය, මුදල් ප්‍රමාණය, රේඛිතද නැද්ද, ඊට මුදල් ලබා ගත යුතු බැංකුව, වවුචර් අංකය හා භාර දෙන ලද දිනය යන විස්තර ඇතුළත් ලියවිල්ලක් තබා ගෙන නොතිබුණි. |
| • මුදල් රෙගුලාසි 756 | 2014 දෙසැම්බර් 15 දින වන විට හෝ ඊට පෙර සමීක්ෂණ මණ්ඩල පත්කර නොතිබුණි. |
| • මුදල් රෙගුලාසි 1645(අ) | දෙපාර්තමේන්තුවේ වාහන පිළිබඳ ලොග් සටහන් පොත් පවත්වා නොතිබුණි. |
| • මුදල් රෙගුලාසි 1646 | දෙපාර්තමේන්තුවේ සංචිත වාහන සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| • මුදල් රෙගුලාසි 1647(අ) | වාහනවලට අදාළ උපකරණවල හා අමතර උපකරණවල ආරක්ෂාව සම්බන්ධයෙන් වෙනස්කම් ඇතිවන කවර අවස්ථාවලදී වුවද, ඒවා භාරගනු ලැබූ බවට සටහනක් වාහන ලොග් පොතෙහි සඳහන් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| **(iii)** | 1994 මාර්තු 04 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනය | තෑගි අරමුදලින් සුරාබදු නිලධාරින්ට, තොරතුරු සපයන්නන්ට හා වෙනත් අයට තෑගි ගෙවීම සඳහා අනුමත ලිඛිත ක්‍රමවේදයක් අනුව සකසා නොතිබුණි. |

(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

-----------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අන්දමින් ක්‍රියාකළ අවස්ථා පහත දැක්වේ.

(i) 1912 අංක 08 දරන සුරාබදු ආඥා පනත යටතේ සිදුකරන ලද වරදවල් සමථ කිරීමෙන් හෝ ආඥා පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍ර, අවසරපත්‍ර හෝ ප්‍රවේශ පත්‍ර අවලංගු කිරීම හෝ අත්හිටුවීම වෙනුවට පනතේ 56 වගන්තිය යටතේ ලද සියලුම මුදල් සුරාබදු අරමුදලට ගෙවිය යුතු බව සඳහන් වේ. දෙපාර්තමේන්තුව විසින් සමථ ගාස්තු ගෙවීම ප්‍රමාදවීම මත අයකරනු ලබන සමථ ගාස්තු දඩ මුදල් සුරාබදු අරමුදලේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම සිදු නොකර ආදායම් සංකේත 20-03-02-99 දරන වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. 2014 අගෝස්තු මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා පමණක් මෙලෙස වෙනත් ආදායම් යටතේ බැර කර තිබුණු මුදල රු.1,615,247 ක් වන අතර 2014 ජනවාරි සිට අගෝස්තු දක්වා අනෙකුත් මාසයන් සඳහා වෙනත් ආදායම් යටතේ බැර කර තිබුණු මුදල විගණනයේදී පැහැදිලිව හඳුනා ගැනීමට නොහැකි විය.

(ii) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ II පරිච්ඡේදයේ 10 වගන්තියට අනුව හා ඊට අදාල සංශෝධනයන්ට අනුව යම් ආයතනයක සේවා හා සැපයුම මත ලැබෙන සැපයුම් හා සේවා වටිනාකම කාර්තුවට රුපියල් මිලියන 3 ක් හෝ වර්ෂයකට රුපියල් මිලියන 12 ක් හෝ ඊට වැඩි වන්නේ නම්, එකතු කළ අගය මත බද්දට අනිවාර්යෙන්ම ලියාපදිංචි විය යුතු වුවත්, දෙපාර්තමේන්තුව එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී නොතිබුණි.

**3.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**---------------------------------------**

බැංකු ගිණුම වෙත සෘජුව ලැබෙන මුදල් හඳුනාගෙන අදාල ආදායම් සංකේතවලට ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු.40,548,665 ක

හඳුනා නොගත් තැන්පත් ශේෂයන් පැවති අතර එයින් රු.200,000 ක ශේෂයක් 2015 සැප්තැම්බර් 30 දින වන විටත් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) සමාගමකින් 2008 ජූලි 09 දිනට හිඟ සුරා බදු ආදායම වෙනුවෙන් දෙපාර්තමේන්තුවට ලැබී තිබූ රු.147,701,421 ක් අධිකරණයේ විභාගවන නඩුව අවසාන වෙන තෙක් ලංකා බැංකුවේ ත්‍රෛමාසික තැන්පතුවක් ලෙස තැන්පත් කර තිබුණි. මෙම තැන්පතුවට අදාල පොලිය ඉහත බැංකු ගිණුමට බැර කිරීමට කටයුතු කළ යුතු වුවත්, ත්‍රෛමාසිකව සමාගමේ බැංකු ගිණුමකට බැර කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉහත නඩුව සඳහා වසර 4 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද, නඩුව 2014 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් වී නොතිබුණු අතර, බැංකුවේ තැන්පත් කර තිබුණු මුදල සඳහා රුපියල් මිලියන 50 කට ආසන්න පොලී මුදලක් ඉහත සමාගමට මේ වන විටත් ලැබී තිබුණි. ඒ අනුව තව තවත් මෙම තීන්දුව ප්‍රමාදවීම මත සමාගමට නඩුවේ ප්‍රතිඵලය අවාසිදායක ලෙස තීරණය වුවද, තැන්පතුවට අදාල පොලිය සමාගමට හිමිවීමට සැලැස්වීම මත විශාල පොළියක් උපයා ගැනීමට සමාගමට ඉඩකඩ සළසා දී තිබුණි.

(ii) නඩුවේ ප්‍රතිඵලය මත රජයට හෝ සමාගමට මෙම තැන්පත් මුදලේ අයිතිය තීරණය වන අතර, එම මුදල අයත්වන පාර්ශවයට මෙම තැන්පත් මුදලේ පොලියද හිමිවිය යුතු වුවද, දැනටමත් එම මුදලේ පොලිය සමාගමට හිමිවීමට ඉඩකඩ සළසාදීම තුළ, මෙම නඩුවේ ප්‍රතිඵලය මත මෙම තැන්පත් මුදල රජයට අයවිය යුතු ලෙස තීරණය වුවහොත්, එයින් රජයට ලැබිය යුතු විශාල පොලී ආදායමක් රජයට අහිමි වේ.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ආපන ශාලාවක් සඳහා සුරාබදු බලපත්‍රයක් ලබා ගැනීම සඳහා 2008 අප්‍රේල් 30 දිනැති අංක 902 දරන සුරාබදු නිවේදනයේ 13(2) වගන්තිය අනුව මිනින්දෝරු සැලැස්මක් ඉදිරිපත් කර තිබුණි. එම මිනින්දෝරු සැලැස්ම සුරාබදු නිවේදනයේ දුර සීමාවන්ට පටහැනි වීම හේතුවෙන් බලපත්‍රය ලබා දීම ප්‍රතික්ෂේප කර තිබුණද, නැවත එම බලයලත් මිනින්දෝරුවරයා විසින්ම දුර සීමාවන්ට පටහැනි නොවන

ලෙස සංශෝධනය කර ඉදිරිපත් කරන ලද සම දින දරන වෙනත් මිනින්දෝරු සැලැස්මක් පදනම් කරගෙන බලපත්‍රයක් නිකුත් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) එකම මිනින්දෝරුවරයා විසින් අවස්ථා දෙකකදී එකම දින දරන මිනින්දෝරු සැලැසුම් 2 ක් වෙනස් දුර ප්‍රමාණයන් දක්වා ඉදිරිපත් කර තිබුණද, දෙපාර්තමේන්තුව බලපත්‍ර නිකුත් කර තිබුණි.

(ii) ඉහත ආපනශාලාව සම්බන්ධයෙන් සුරාබදු බලපත්‍රය නිකුත් කිරීම ආරම්භයේ පටන් මහජන විරෝධතා වාර්තා වී තිබූ බැවින් රජයේ මිනින්දෝරු වාර්තාවක් ලබා ගැනීමට කටයුතු නොකර බලපත්‍ර ලබා දීමට කටයුතු කර තිබුණද, පසුව එනම්, 2015 පෙබරවාරි 25 දින මෙම බලපත්‍රය අත්හිටුවීමට සිදු වී තිබුණි.

## 3.10 අවිධිමත් ගනුදෙනු

---------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථාවක් පහත දැක්වේ.

කොළඹ 08 ඇල්විටිගල මාවතෙහි පිහිටි කොළඹ සුරාබදු නගර කාර්යාලය මසකට රු.775,000 ක කුලී පදනම මත ලබා ගෙන තිබුණු ගොඩනැගිල්ලෙහි 4 වන මහල මාණ්ඩලික නිලධාරියෙකුගේ නිල නිවාසයක් සඳහා දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබුණි. නමුත් නිලධාරීන්ගේ මාසික වැටුපෙන් සියයට 12.5 ක් අයකිරීම මත රජයේ නිලධාරීන්ට පදිංචිය සඳහා ලබා දිය හැකි වන්නේ රජයේ නිවාස වුවත්, කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලේ මහලක් නිල නිවාසයක් සඳහා ලබාදී තිබුණි.

## 3.11 පාඩු හා හානි

-----------------

සමාලෝචිත වර්ෂයේදි වාහන අනතුරක් සම්බන්ධයෙන් සිදු වූ අලාභය රු.1,091,810 ක් වූ අතර රු.763,304 ක් රක්ෂණ වන්දි ලෙස ලැබී තිබුණි. රු.328,506 ක් වූ ඉතිරි අලාභහානිය වගකිව යුතු නිලධාරියාගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.12 කළමනාකරණ දුර්වලතා

-----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛයට අනුව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට වර්ෂය තුළදී මිලදී ගනු ලබන සියලුම වත්කම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු වුවත්, සුරාබදු තැගි අරමුදලින් ලී බඩු සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම් සඳහා වැය කර තිබු රු.14,123,123 ක් දෙපාර්තමේන්තුවේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට පුද්ගලික සමාගම් තුනකින් සුරාබදු හිඟ ආදායම වශයෙන් පිළිවෙලින් රු.311,828,527 ක්, රු.682,615,916 ක් හා රු.128,180,147 ක් අයවිය යුතුව පැවති අතර, එම හිඟ ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම සමාගම් විසින් හිඟ ආදායම් ගෙවීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම් ඇතිකරගෙන තිබු නමුත්, එම ගිවිසුම් ප්‍රකාරව වාරික මුදල් ගෙවීම් සිදුකර නොතිබුණි.

(ii) වාරික මුදල් බැංකු අණකරයකින් හෝ ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ගෙවිය යුතු බවට ගිවිසුමේ 04 වන ඡේදයේ සඳහන් කර තිබුණද, චෙක්පත් මගින් මෙම වාරික මුදල් ගෙවීම සිදුකර තිබු අතර, එලෙස ගෙවීම් කළ චෙක්පත් 2 ක් අගරු වී තිබුණි.

(iii) වාරික මුදල් ගෙවීම ප්‍රමාද වූ අවස්ථා පැවතියද, ගිවිසුම් අනුව කටයුතු කර නොතිබුණි.

(iv) වාරික මුදල් ගෙවීම් කළ දිනය ලෙස චෙක්පත් තැන්පත් කළ දිනය සඳහන් කර තිබුණි.

## 3.13 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-----------------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 57 | 37 | 20 |
| (ii) තෘතියික මට්ටම | 380 | 311 | 69 |
| (iii) ද්විතියික මට්ටම | 860 | 586 | 274 |
| (iv) ප්‍රාථමික මට්ටම | 169 | 122 | 47 |
| **එකතුව** | **1,466** | **1,056** | **410** |

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 410 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.